# මුහුදු වෙරළක දවසක්



ටෂිනි ඔලිවියා නුවරපක්ෂ

# මුහුදු වෙරළක දවසක්

**ටෂිනි ඔලිවියා නුවරපක්ෂ**

**4 ශ්‍රේණිය**

**මහාමායා බාලිකා විදුහල - මහනුවර**

# මුහුදු වෙරළක දවසක්

**කර්තෘ**
ටෂිනි ඔලිවියා නුවරපක්ෂ

ISBN 978-624-208-331-5

**ප්‍රථම මුද්‍රණය**
2022 පෙරවාරි 08

**මුද්‍රණය**
පන්හිඳ ප්‍රින්ටර්ස්, මහනුවර
071 8 822 822

# පිදුම

**සියල්ල දී**

**මා ලොව දිනන තුරු**

**බලා සිටිනා**

**අප්පච්චිටත් .......**

**අම්මාටත් .......**

# පෙරවදන

සාහිත්‍යය දියුණුව රටක සංවර්ධනය මනින මිනුම් දණ්ඩකි ලක් ඉතිහාසයේ කෝට්ටේ, දඹදෙණි යුග කැපීපෙනෙන්නේ ද සාහිත්‍යමය වශයෙන් ප්‍රබෝධවත් කාලපරිච්ඡේද නිසාය. එසේ නම් මහාමායා ඉතිහාසයේ ද සාහිත්‍යමය වශයෙන් ස්වර්ණමය අවධිය මෙයයි දැනට වසර ගණනාවක සිට අපගේ දියණියන් ග්‍රන්ථකරණය තුළින් විස්කම් පෑම එයට හේතුවයි. පාසල තුළ පොත් ලියන සංස්කෘතියක් ගොඩ නගා එය රටේම පාසල් පද්ධතියට ව්‍යාප්තකර මෙවර ගෝලීය ශිෂ්‍ය ප්‍රජාව ම ඊට සම්බන්ධ කරගැනීමට අප ගත්කතුවරියන් සමත්වීම සුවිශේෂ සිදුවීමකි.

ඉන් ඔබ්බට යමින් මෙවර පාසල් ප්‍රජාවම ආදි කතෘ කරදන අත්ථදස්සි මාහිමිපාණන් වහන්සේට උපහාර පිණිස අතීත යතිවර ලේඛක සම්ප්‍රදාය රට තුළ යළි ගොඩනගන්නට පිරිවෙන් ශිෂ්‍ය භික්ෂුන් වහන්සේලා ද ග්‍රන්ථකරණයට යොමුකරන "හෙරණගත්කරණි" ව්‍යාපෘතිය හඳුන්වා දෙන්නට විය.

මෙම ශාස්ත්‍රිය සහ ශාසනික සේවාවෙන් රටේ පාසල් අධ්‍යාපනයේ සහ පිරිවෙන් අධ්‍යාපනයේ ගුණාත්මක වෙනසක් ඇතිකරන්නට නායකත්වය දීමට ලැබීම එහි විදුහල්පතිනිය වශයෙන් මා හට අභිමානයක් වන අතරම පාසලක් වශයෙන් ලබන ජයග්‍රහණයක් ද වෙයි. ජීවිතයේ මුල් අවධියේම තම සහජ කුසලතාව හඳුනාගනිමින් ලේඛන කරණයට යොමුවීමේ ප්‍රතිඵලයක් ලෙස එළිදකින මෙම කෘතිය ඉදිරි අධ්‍යාපනය සඳහා මෙන්ම අනාගත දිවිය සඳහා අත්වැලක් වනු නො අනුමානය.

විදුහල්පතිනිය,
ශශිකලා සේනාධීර,
මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර.

හිරු එළිය හොඳින් වැටී ඇති දවසක අපි මුහුදු වෙරළට ගියෙමු. නිවාඩුවකට මා යාමට කැමති ම මුහුදු වෙරළට ය.



මමත් මල්ලීත් වැල්ල පුරාම ඇති පුංචි පුංචි ලස්සන හැඩයේ සිප්පි කටු එකතු කරගත්තෙමු.
වැල්ලේ ඇවිදින විට කකුල් වලට රස්නයක් දැනුණි.



මම වැල්ලේ පා සටහන් පෙළට තැබුවෙමි. රැල්ල ඇවිත් එය මකා දමන දෙස බලා මම දුක්වුණෙමි. එය අපූරු සිදුවීමක් යැයි මට සිතුණි.
මමත් මල්ලීත් රැල්ල සමග සෙල්ලම් කරන්නට වූයේ හරිම සතුටින්ය.




මුහුදු පතුලේ සිටින අලංකාර මාළුන් සහ දියකිඳුරියන් ගැන කතා ද මුහුද දෙස බලා සිටි මට මතක් විය.

මුහුදු පතුල යටට ගොස් බලන්නට ඇත්නම් මට සිතුණි.



මුහුදේ සිටින විශාල ම සත්ත්වයා සහ ඉතාමත්ම දරුණුම මත්ස්‍ය වර්ගය ලෙස මෝරා ගැනද අම්මා සහ අප්පච්චි මටත් මල්ලීටත් කියා දුන්නා ය.



මුහුදු රළ වේගයෙන් ඇදී විත් මා මුහුදට ඇදගෙන යනසේ දැනුණි.
එනිසා මම ගොඩක් ඈතට නොගොස් රළ සමඟ සෙල්ලම් කළෙමි.



මුහුදට කිට්ටුවෙන් ඇති විශාල පහන් කණුවක් පෙන්වා එය ප්‍රදීපාගාරය බව අප්පච්චී අපිට කියා දුන්නේ ය.

මුහුදේ ගමන් කරන නෞකාවන්ට දිශාවන් පෙන්වීමට එය ප්‍රයෝජනවත් බවද කියා දුන්නා ය.



සවස් වෙද්දී බැස යන හිරු ගිනි බෝලයක් මෙන් අහසේ දිස්විය. එය සිතුවමක් වැනි ය.




මුහුද සහ අහස එකට එකතු වී වගේ පෙනෙන ඈත ක්ෂිතිජය දෙස අම්මීත් අප්පච්චීත් අත් අල්ලාගෙන සතුටින් ඒ දෙස බලා සිටියේ ය.




මුහුදේ ඇති ලස්සන සහ භයානක කමද මම මුහුද දෙස බලාගෙන සිතුවෙමි.



අපට අමතක නොවන මතක රැසක් සමග සතුටින් මෙන්ම දුකින් ද හවස් වේගෙන එද්දී මුහුදු වෙරළෙන් සමුගත්තෙමු.



මල්ලීත් මමත් නින්දට ගියේ මෙවන් දවසක් ලබාදුන් අම්මාටත් අප්ච්චිටත් ස්තූති වන්ත වෙමිනි.



# පසුවදන



රටේ අනාගත සංවර්ධනයට ඉවහල්වන සාහිත්‍යය ප්‍රබෝධයත් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවත් සාහිත්‍ය නිර්මාණකරණය විභවතා කොටගත් අනාගත පරපුරේ හැකියාවන් ඔනැංවීම සහ එළිදැක්වීමට වේදිකාවක් ගොඩ නැගීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ පටන් මාගේ සංකල්පයකට අනුව ක්‍රියාත්මක පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය යටතේ මේ වන විට ලේඛක අංකුර හැට දහසකට වැඩි ප්‍රමාණයක් දේශීය සාහිත්‍ය කෙතේ රෝපණය කිරීමට ලැබීම අප ලැබූ භාග්‍යයකි. එම බීජ දළුලා වැඩෙන්නට අවැසි සරු පසක් සැකසීම සමාජ වගකීමයි. පාසලක් මුල්වීමෙන් අධ්‍යාපනයේ ඵලදායිතාව වෙනුවෙන් වසර ගණනාවක් අඛණ්ඩව පාසල් කලාප, පළාත්, ජාතික සහ ජාත්‍යන්තර තලය දක්වා ක්‍රියාත්මක කර ඇති මෑත ඉතිහාසයේ එකම ව්‍යාපෘතිය මෙයයි.

මෙවර ඒ සඳහා පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද සම්බන්ධ කර ගැනීම විශේෂත්වයකි. මෙහිදී මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පති තුමිය, දියණියන්, ගුරුභවතුන්, දෙමාපියන් සහ ආදි ශිෂ්‍යාවන් දැක්වූ කැප කිරීමට ජාතියේ ප්‍රණාමය හිමිවිය යුතුය.

මුද්‍රිත පොත තවමත් අපේ අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලමයි. පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන් කිසිවකින්වත් ලබාදිය නොහැකිය. මානව දැනුම ගබඩාකර තැබීමට විවිධ විද්‍යුත් උපාංග භාවිතයට එක්වීමත් සමඟ දරුවන් එයින් දුරස්වීම අධ්‍යාපනයේ ගුණාත්මක බවට අනර්ථකාරී මෙන්ම සමාජය තුළ විවිධ ගැටලු ප්‍රශ්න නිර්මාණය වීමට හේතු වී ඇති බව පර්යේෂණාත්මක ව සනාථ වෙයි. මෙයට පිළියම් වශයෙන් ක්‍රියාත්මක මෙම ව්‍යාපෘතියෙන් වසර ගණනාවක් මුද්‍රිත පොත් රචනාකර ඩිජිටල් තාක්ෂණය යුගයේ ස්මාර්ට් බාල පරම්පරාව නූතන තාකෂණය සමග ගළපමින් දැනට වසර දෙකක සිට රටේම පාසල් දරුවන් සමග එක්ව විද්‍යුත් කෘති රචනාකරයි. තම නිර්මාණ ජාත්‍යන්තර පාඨකයන් වෙත ගෙනයාමට මහාමායා බාලිකාවයන් ඩිජිටල් වේදිකාවක් ගොඩනගා දී තිබේ තම නිසඟ, සාහිත්‍ය නිර්මාණ හැකියාව තුළින් එයට පිවිසි පුංචි ගත්කතුවර ඔබගේ ලේඛන දිවියට මගේ සුභාෂිංසන.

ව්‍යාපෘති නිර්මාතෘ සම්බන්ධීකාරක,
සෙනෙවිරත්න මහලේකම්

ISBN 978-624-208-331-5